# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report 2018



වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
பெருந்தோட்ட கைத்தொழில் அமைச்சு
Ministry of Plantation Industries



# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2018


***වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය***
***11 වන මහළ, සෙත්සිරිපාය දෙවන අදියර, බත්තරමුල්ල***

දුරකථන **011 – 2186160**
ෆැක්ස් **011 – 2186076**
වෙබ් අඩවිය **http://www.plantationindustries.gov.lk**

**සැලසුම් අංශය**

දුරකථනය - 011 2187074 (අධ්‍යක්ෂ)
ෆැක්ස් - 011 2187075
විද්‍යුත් තැපැල - mpiplanningdiv@gmail.com



## වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය නවීන් දිසානායක මැතිතුමාගේ පණිවිඩය

ඉන්දියන් සාගරයේ මුතු ඇටය නම් විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව වර්ග කිලෝ මීටර් 65000 ක භූමි ප්‍රමාණයකින් සමන්විත කුඩා දිවයිනකි. රටට ආවේනික වූ භෞතික හා දේශගුණික සාධක මෙන්ම දසත පැතුරුණු ගංගා ජලය තුළින් ලැබෙන ජලස්කන්ධය භූමිය සාරවත් කරමින් වැවිලි කර්මාන්තයට නිරන්තර අත්වැලක් වන්නේය.

මෙවන් හිතකර පරිසර සාධක තත්ත්වයක් යටතේ ජාතික ආර්ථිකය හරහා දේශිය හා විදේශිය වෙළඳපොල තරණය කිරීමට අපේ රටේ ප්‍රධාන වැවිලි භෝග වන තේ, පොල් සහ රබර් වගාවට අද වන විට හැකියාව ලැබී ඇත. එමෙන්ම රැකියා නියුක්තිය කෙරෙහි කැපී පෙනෙන දායකත්වයක් සපයන වැවිලි අංශය මේ වන විට රටෙහි ප්‍රධාන ආර්ථික බලවේගයක් ලෙස ක්‍රියාකරන අතර ග්‍රාමීය වැවිලි ක්ෂේත්‍රය ද ශක්තිමත් කරමින් වැවිලි කර්මාන්තයේ ශක්තිමත්භාවය තහවුරු කර ඇත.

කඩිනම් සංවර්ධන සැලැස්මක් සහිත තේ, පොල්, රබර් සහ උක් වගාව නඟාසිටුවීම සඳහාත් කජු වගාව රට තුල ප්‍රචලිත කර දේශීය හා විදේශීය වෙළඳපොල සමඟ සම්බන්ධ වී රටේ ආර්ථික සංවර්ධනයට සෘජුවම දායක වීමට අප අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම මෙම සියළුම අංශයන් සඳහා අවශ්‍ය වන දැනුම හා නවීන තාක්ෂණය, නව පර්යේෂණාගාර භාවිතය හා පුහුණුව ලබා දී වගාකරුවන් සාමාජීය හා වාණිජ්‍යය වශයෙන් ශක්තිමත්කර දිගු කාලීන හා කෙටිකාලීන සැලසුම් ක්‍රියාත්මක කරමින් ඉලක්ක සපුරා ගනිමින් පවතී.

ඒ අනුව දැනුම, නවීන තාක්ෂණය සහ ශ්‍රමය භාවිතා කරමින් තිරසාර කළමනාකරණය තුළින් සාමාජීය හා වාණිජ්‍යය නැඹුරුවකින් යුතුව ගෝලීය තරඟකාරි වැවිලි ආර්ථිකයක් බිහිකිරීම උදෙසා මූලිකත්වය ගන්නා වගාකරුවන්, වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සියළුම ආයතනික ප්‍රධානීන්, නිළධාරින්, කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා ඇතුළු සියළුම නිළධාරින්ට මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

නවීන් දිසානායක (පා.ම)
වැවිලි කර්මාන්ත අමාත්‍ය



## වැවිලි කර්මාන්ත ගරු රාජ්‍ය අමාත්‍ය වඩිවේල් සුරේෂ් මැතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා වැවිලි ක්ෂේත්‍රයේ නව මාවත් විවර කරමින් අපේ රටේ තේ, පොල්, රබර් වගාවට අමතරව උක් සහ කජු වගාව කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරමින් වැවිලි කර්මාන්තය මඟින් ආර්ථිකය ශක්තිමත් කරමින් රටේ සංවර්ධනය සඳහා සෑපුම දායකත්වයක් ලබා දීම අප අමාත්‍යාංශයේ මූලික පරමාර්ථය වේ.

ප්‍රධාන අපනයන භෝගයක් වන තේ වගාව කන්ද උඩරට ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන අතරම වැවිලි ක්ෂේත්‍රයන්ට සම්බන්ධ පොල්, රබර්, උක් සහ කජු වගා කරන ජනතාවගේ ද ආදායම් මාර්ග ඉහළ නැංවීම ප්‍රමුඛ බලාපොරොත්තුව වන අතර රටේ රැකියා නියුක්තියට මෙය විශාල දායකත්වයක් වනු ඇත.

නවීන තාක්ෂණය, පර්යේෂණ හා ශ්‍රම දායකත්වය එකතු කරමින් රටේ ශ්‍රමික ජනතාවගේ ශ්‍රමය ලබා ගෙන නව සංවර්ධන මාවතක් කරා වැවිලි කර්මාන්තය ලඟා කරමින් ඉහළ දායකත්වයක් ලබා දීම අප කාගේත් අරමුණ වේ.

වැවිලි ක්ෂේත්‍රයේ වගාව හා අගය එකතු කිරීම් සඳහා නව පර්යේෂණ ඔස්සේ නවීන තාක්ෂණය එක් කරමින් වැවිලි ක්ෂේත්‍රයෙන් රටේ ජාතික නිෂ්පාදනය ඉහළ නංවමින් ඉහළ අපනයන ආදායමක් ද රටට ලබා ගැනීම අප කාගේත් අපේක්ෂාවයි.

ඒ සඳහා යන ගමන් මගේ මාගේ ගරු ඇමතිතුමාට මාගේ පූර්ණ සහය හා දායකත්වය ලබා දෙන අතර වැවිලි ක්ෂේත්‍රයේ සිටින පාර්ශවයන්ට හා අමාත්‍යාංශයීය ලේකම්තුමා ඇතුළු නිළධාරීන් හා අනුබද්ධ ආයතන නිළධාරීන් ලබා දෙන සහය ඉතා අගය කරමි.

වඩිවේල් සුරේෂ් (පා.ම)
වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය



# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයීය ලේකම් ජේ.ඒ. රංජිත් මහතාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ජනරජය යටතේ පවතින ඕනෑම රාජ්‍ය ආයතනයක රාජ්‍ය සම්පත් යොදා ගනිමින් වර්ෂයක් පුරා සිදු කරනු ලබන සමස්ථ කාර්යයභාරයේ ප්‍රතිඵල පිළිබඳ පුළුල් සමාලෝචනයක් වාර්ෂික කාර්යසාධන වාර්තාව මඟින් විද්‍යාමාන වේ.

වැවිලිකර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය පථයට අයත් වනුයේ ප්‍රධාන වැවිලි භෝගයන් වන තේ, රබර්, පොල් සහ උක් යන ක්ෂේත්‍රයන් හි නිෂ්පාදනය, ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම මඟින් ජාතික නිෂ්පාදිතයට ඉහළ දායකත්වයක් ලබා දීම, විදේශ විනිමය සඳහා වන දායකත්වය ඉහළ නැංවීම, වැවිලි ක්ෂේත්‍රයට අදාළ කුඩා පරිමාණ ගොවීන්, වැවිලිකරුවන් ප්‍රවර්ධනය හා දිරිගැන්වීම තුළින් රටේ ඒකපුද්ගල ආදායම ඉහළ නැංවීමයි.

මෙයට අමතරව 2018.12.28 දිනැති 2103 / 33 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් අප අමාත්‍යාංශය යටතට පෙර තිබු ආයතන 14 ද ඇතුළුව උක් හා කජු යන භෝගයන් සම්බන්ධ ආයතනද ඇතුලත්ව ආයතනද 25 ක් අප විෂය පථය පුළුල් වී ඇත. 2018 වර්ෂය තුළ කාර්යසාධක දර්ශකයන් හා ඉලක්කයන් කොතෙකුත් දුරට ළඟා කරගත්තේ ද යන්න මෙම වාර්තාව තුළ සවිස්තරව දක්වා ඇත.

මෙම කාර්යභාරය සාර්ථකව හා සඵලදායි ලෙස ඉටුකිරීමෙහි ලා මාගේ ගරු අමාත්‍යතුමාගේ නායකත්වයත්, ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟපෙන්වීමත් අමාත්‍යාංශ කාර්යය මණ්ඩල සමාජිකයන්ගේ සහ අමාත්‍යාංශයට අනුබද්ධ සියළුම ආයතනයන් හි ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයේ දායකත්වය හා කැපවීම පිළිබඳව සතුටින් සඳහන් කරමි.

2018 වර්ෂයේ අප ළඟාකරගත් සාර්ථකත්වයන්, අසාර්ථකත්වයන් මුහුණ දුන් අභියෝගයන්, විශේෂයෙන් කාළගුණ විපර්යාසයන් නිසා ඇති වු තේ හා රබර් නිෂ්පාදනයේ පහත වැටීම්, ජාත්‍යන්තර ප්‍රවනතා හා බලපෑම් ආදිය තුළින් උගත් පාඩම් තුළිනුත් ලැබගත් අත්දැකීම් ප්‍රයෝජනයට ගෙන ඉදිරි වර්ෂයේ වඩාත් වර්ධනීය කාර්යසාධනයක් අපේක්ෂා කරමි.

ජේ.ඒ. රංජිත්
ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# දැක්ම

වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මඟින්
ජාතික සෞභාග්‍යය උදා කිරීම

# මෙහෙවර

ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන්
තහවුරු වූ වැවිලි කර්මාන්තයේ
ඵලදායීතාව, ලාභදායීතාව සහ තිරසාරත්වය
ඉහළ නැංවීම

# තේ,රබර් හා පොල් ක්ෂේත්‍රයේ උපාය මාර්ගික සංවර්ධන අරමුණු

- වැවිලි ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම
- ලෝක වෙළඳපොළේ තරඟකාරීත්වයට මුහුණදිය හැකි පරිදි වැවිලි භෝග ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම
- වැවිලි භෝග ආශ්‍රිත කර්මාන්ත සඳහා නව තාක්ෂණික ක්‍රම උත්පාදනය හා වැඩිදියුණු කිරීම
- වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- දේශීය පාරිභෝගිකයන්ට තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබාදීම
- විදේශ විනිමය ඉපැයීම ඉහළ නැංවීම
- නිෂ්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීම
- කුඩා වතු හිමියන්ගේ සහ වැවිලි සමාගම්වල ලාභදායකත්වය ඉහළ නැංවීම
- පරිසර සංරක්ෂණය තුලින් තිරසාර සංවර්ධනය සහතික කිරීම
- වැවිලි ඉඩම්වල අතුරු භෝග හා සත්ත්ව පාලන ප්‍රවර්ධනය







# පටුන


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 01 – 03 |
| 02 | තේ ක්ෂේත්‍රය | 04 – 12 |
| 03 | රබර් ක්ෂේත්‍රය | 13 – 20 |
| 04 | පොල් ක්ෂේත්‍රය | 21 – 25 |
| 05 | උක් ක්ෂේත්‍රය | 26 |
| 06 | කටුපොල් ක්ෂේත්‍රය | 27 |
| 07 | වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය | 27 – 29 |
| 08 | තේ, රබර් හා පොල් වතු (කැබලි කිරීමේ) පාලන මණ්ඩලය | 29 – 31 |
| 09 | කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය | 31 – 32 |
| 10 | අමාත්‍යාංශයට සෘජුව ප්‍රතිපාදන ලැබුණු සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය | 33 – 36 |
| 11 | විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්<br>• ලෝක රබර් සමුළුව - 2018 | 37 |
| 12 | මානව සම්පත් කළමනාකරණය | 38 – 43 |
| 13 | අභ්‍යන්තර විගණන කටයුතු | 44 |
| 14 | සැලසුම් හා මෙහෙයුම් කටයුතු | 45 – 47 |
| 15 | ගිණුම් කටයුතු | 48 – 49 |
| 16 | 2019 අතුරු සම්මත ගිණුමෙන් අනුමත ප්‍රතිපාදන | 49 |
| 17 | 2019 අතුරු සම්මත ගිණුමෙන් ප්‍රතිපාදන වෙන් වූ ව්‍යාපෘති | 50 |
| 18 | 2019 අයවැයෙන් ප්‍රතිපාදන අපේක්ෂිත ව්‍යාපෘති | 51 |

# හැදින්වීම






**තේ, රබර්, පොල් යන භෝගයන්ට අදාළ සියලු විෂයයන් හා අනුබද්ධ ආයතන මෙහෙයවීමෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයීය විවිධ අංශයන්හි ක්‍රියාකාරීත්වය තුළ වැවිලි ක්ෂේත්‍රය සහ අමාත්‍යාංශය අත්කර ගනු ලැබූ කාර්යසාධනය හා ඉදිරි වර්ෂයේ සැලසුම් ඇතුළත් කරමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයීය “කාර්යසාධන වාර්තාව 2018” සකස් කර ඇත.**

## 2015 සැප්තැම්බර් මස 21 දිනැති අංක 1933/13 ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු කාර්යයන් හා කර්තව්‍යයන්

- වැවිලි භෝගවල ඵලදාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සානුබල සහ අනෙකුත් පහසුකම් සැලසීම
- වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉහළ නැංවීම
- වැවිලි භෝග මත පදනම් වූ එකතුකළ වටිනාකම වැඩිකිරීම සම්බන්ධ කර්මාන්ත නඟාසිටුවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- තේ හා රබර් සම්බන්ධ බලපත්‍ර නිකුත් කිරීම
- තේ අපනයනය සඳහා අවසර පත් නිකුත් කිරීම
- තේ හා රබර් වතු කැබලි කිරීම සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීම සහ පාලනය
- බහුභෝග වගාවන් සහ සංගත ගොවිපල ක්‍රම තුළින් වැවිලි ඉඩම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සහ එමඟින් නිෂ්පාදනය හා සේවා නියුක්තිය වැඩි කරලීම
- තේ, රබර් සහ පොල් කර්මාන්ත සංවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන සඳහා ව්‍යවසායන් හා ව්‍යුහාත්මක වෙනස්කම් හඳුන්වාදීම

# අමාත්‍යාංශයීය කාර්යයන් ඉටු කිරීමට අනුබද්ධ වූ ආයතන

## 2015 සැප්තැම්බර් මස 21 දිනැති අංක 1933/13 ගැසට් පත්‍රයට අනුව අමාත්‍යාංශයට පැවරුණු ආයතන

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
- ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා තේ මණ්ඩලය
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
- තේ, රබර් හා පොල් වතු (කැබලි කිරීමේ) පාලන මණ්ඩලය
- තේ ශක්ති අරමුදල (ප්‍රතිව්‍යුහගත කර ඇත)
- තුරුසවිය අරමුදල
- රබර් පර්යේෂණ ආයතනය
- පොල් වගාකිරීමේ මණ්ඩලය
- පොල් සංවර්ධන අධිකාරිය
- පොල් පර්යේෂණ ආයතනය
- තේ පර්යේෂණ ආයතනය
- ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව
- සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව

## 2018.12.28 දිනැති අංක 2103 / 33 අති විශේෂ ගැසට් පත්‍රයෙන් පහත ආයතන ද අමාත්‍යාංශයට අනුබද්ධ විය

- සී/ස ඇල්කඩුව වැවිලි සමාගම
- ශ්‍රී ලංකා කජු සංස්ථාව
- සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම
- සී/ස හලාවත වැවිලි සමාගම
- කන්තලේ සීනි සමාගම
- සී/ස කුරුණෑගල වැවිලි සමාගම
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
- සී/ස හිඟුරාණ සීනි කර්මාන්ත සමාගම
- උක් පර්යේෂණ ආයතනය
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය

# තේ ක්ෂේත්‍රය



## සමාලෝචනය

වර්ෂ 2018 දී සමස්ත තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.මිලි 303.84ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 1.26%ක පහළ යාමකි. කුඩා තේ වතු අංශයේ උඩරට හා පහතරට කලාපයන්ට මෙන්ම උඩුපුස්සැල්ලාව කෘෂි දේශගුණික කලාපයන්ට බලපානු ලැබූ අයහපත් කාලගුණ තත්ත්වය මීට හේතුවිය. සමස්ත තේ නිෂ්පාදනයට කුඩා තේ වතුහිමියන්ගේ දායකත්වය 75%ක් විය. ප්‍රාදේශීය වැවිලි සමාගම්හි නිමි තේ නිෂ්පාදනය කි.ග්‍රෑ.මිලි 98.59 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 1.57%කින් පහළ ගොස් තිබූ නමුත් ඔවුන්ගේම දළු මඟින් නිමි තේ නිෂ්පාදනය 0.2%ක් ඉහළ ගොස් තිබුණි.

2018 වර්ෂයේ ජනවාරි මසදී සකස් කළ තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 637.75ක් වූ අතර එය 2017 වර්ෂය ආරම්භයට සාපේක්ෂව 6.8%ක ඉහළ යාමකි. වර්ෂය මැදදී තේ කිලෝ ග්‍රෑමයක වෙන්දේසි සාමාන්‍ය මිල රු. 545.67ක් වූ අතර එය පසුගිය වර්ෂයේ සමාන කාලයට සාපේක්ෂව 10%ක පහළ යාමකි. වර්ෂය අග වන විට සකස් කළ තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල රු. 572.64ක් විය. වර්ෂය පුරා වූ මිල අනුව වර්ෂයේ සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රු. 581.93කි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 5.86%ක පහළ යෑමකි.

වර්ෂය තුළ සමස්ත නිෂ්පාදනයෙන් කි.ග්‍රෑ.මිලි 271.78ක් හෙවත් 89%ක් අපනයනය කර ඇති අතර ප්‍රතිඅපනයනය කි.ග්‍රෑ.මිලි 10.59කි. ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් 10 අතරින් තුර්කිය, රුසියාව, ඉරානය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හා අසර්බයිජානය යන රටවලට සිදුකළ තේ අපනයනය පිළිවෙලින් 5.72%, 8.39%, 12.78%, 29.82% හා 14.02%කින් පහළ යනු ලැබීය. නමුත් ඉරාකය ලිබියාව, සිරියාව, චීනය හා චිලී යන රටවල් සඳහා වූ අපනයනයන් පිළිවෙලින් 9.71%, 17.89%, 37.58%, 1.18% හා 6.24කින් ඉහළ යනු ලැබීය. තේ අපනයන ආදායම රු.බිලි 237.7 ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 0.69%කින් පහළ යෑමකි. තේ අපනයනයේදී නැ.වි.ස.මිල කිලෝවකට සාමාන්‍ය රු. 820.75ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 1.65% ඉහළ යෑමකි.

තේ අපනයනයේදී කිලෝ ග්‍රෑමයකට රු. 10.00ක ස්ථාවර සෙස් බද්දක් අයකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. තේ වගාවේ පර්යේෂණ සම්බන්ධව සහයෝගීව කටයුතු කිරීමට ඉන්දියාව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමත් ජයිකා ආයතනය සමඟ ක්ෂේත්‍ර අධ්‍යයනයන් සිදුකිරීමත් සිදුවිය. තේ පර්යේෂණ ආයතනයේ විශේෂ පර්යේෂණ ව්‍යාපෘති 02කට හා එම ආයතනයේ රසායනාගාර හා යටිතල පහසුකම් ඉහල නැංවීමේ විශේෂ ව්‍යාපෘතියකට ප්‍රතිපාදන සපයන ලදී. කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ තේ නැවත වගාව හෙක්. 737ක් හෙවත් සමස්ත ඉලක්කයෙන් 13%ක් සම්පූර්ණ කර තිබුණි.

## තේ ක්ෂේත්‍රයේ සමස්ත කාර්යසාධනය

| විස්තරය | ප්‍රගතිය | | ඉලක්ක |
|---|---|---|---|
| | වර්ෂය 2017 | වර්ෂය 2018 | වර්ෂය 2019 |
| තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි.) | 307.72 | 303.84 | 310.00 |
| අපනයන ආදායම (රු.බිලි.) | 233.30 | 231.70 | 235.00 |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 288.89 | 282.37 | 290.00 |
| නැවත වගාව (හෙක්.) | 677.60 | 1026.80 | 871.00 |
| නව වගාව (හෙක්.) | 202.00 | 435.00 | 400.00 |
| කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල (රු.) | 618.18 | 581.93 | 585.00 |

## කුඩා තේ වතු අංශය

### සමස්ත කාර්යසාධනය

| විස්තරය | වර්ෂය | | ඉලක්ක |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| කුඩා වතු හිමියන්ගේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි) | 232.417 | 228.126 | 237 |
| සමස්ත තේ නිෂ්පාදනයේ දායකත්වය (%) | 75.5 | 75.5 | 76 |
| ඵලදායීතාවය (හෙක්ටයාරයට/සකස්කළ තේ/ කිලෝ) | 1995 | 1958 | 2100 |

### තේ නිෂ්පාදනය

| උන්නතාංශය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| උඩරට තේ (කි.ග්‍රෑ.මිලි) | 13.079 | 11.963 | -8.53 |
| මැදරට තේ (කි.ග්‍රෑ.මිලි) | 28.811 | 30.957 | 7.45 |
| පහතරට තේ (කි.ග්‍රෑ.මිලි) | 190.527 | 185.206 | -2.79 |
| එකතුව (කි.ග්‍රෑ.මිලි) | 232.417 | 228.126 | -1.85 |

## ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ රාජ්‍ය ආයතන

### තේ නිෂ්පාදනය අදාළ ආයතනයේ වතු මඟින් (කි.ග්‍රෑ.මිලි.)

| ආයතන කාණ්ඩය | වර්ෂය | | වෙනස % |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් | 73,214 | 73,362 | 0.2 |
| රාජ්‍ය අංශය | 1,763 | 2,040 | 16.0 |
| සමූපකාර | 327 | 314 | -4.0 |
| පෞද්ගලික | 4,539 | 6,488 | -43.0 |
| එකතුව | 79,843 | 82,204 | 3.0 |

## තේ නිෂ්පාදනය

### සමස්ත තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මිලි)

| ආයතන කාණ්ඩය | වර්ෂය | | වෙනස % |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් | 100,145 | 98,593 | -1.55 |
| රාජ්‍ය අංශය | 7,302 | 7,760 | 6.27 |
| සමූපකාර | 3,734 | 3,769 | -0.94 |
| පෞද්ගලික | 196,539 | 193,721 | -1.43 |
| එකතුව | 307,720 | 303,843 | -1.26 |

### කෘෂි දේශගුණික කලාප අනුව (කි.ග්‍රෑ.මිලි)

| දේශගුණික කලාපය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2017 | 2018 | වෙනස (%) |
| නුවරඑළිය | 3,320,577 | 3,493,233 | 5.20 |
| බටහිර කඳුකරය | 41,802,867 | 43,819,819 | 4.82 |
| මැදරට | 45,307,159 | 47,085,945 | 3.93 |
| උඩුපුස්සැල්ලාව | 5,624,545 | 5,420,767 | -3.62 |
| ඌව | 27,620,231 | 25,732,768 | -6.83 |
| පහතරට | 183,386,480 | 178,391,701 | -2.72 |
| එකතුව | 307,061,858 | 303,944,234 | -1.02 |

### උන්නතාංශ අනුව (කි.ග්‍රෑ.මිලි)

| ප්‍රදේශය | වර්ෂය | | | | වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2017 | | 2018 | | | |
| | කි.ග්‍රෑ.මිලි. | % | කි.ග්‍රෑ.මිලි | % | කි.ග්‍රෑ.මිලි | % |
| උඩරට (උස) | 64,643 | 21.01 | 64,806 | 21.33 | 163 | 0.25 |
| මැදරට (මැද) | 45,655 | 14.83 | 47,024 | 15.48 | 1,369 | 3.00 |
| පහතරට (පහත්) | 197,422 | 64.16 | 192,013 | 63.19 | -5,409 | -2.74 |
| එකතුව | 307,720 | 100.00 | 303,843 | 100.00 | -3,877 | -1.26 |

### නිෂ්පාදන පිරිවැය

| විස්තරය | 2017 | 2018 | 2019 ඉලක්ක |
|---|---|---|---|
| අමු දලු කිලෝවක නිෂ්පාදන පිරිවැය (රු.) | 71.65 | 68.31 | 68.00 |

## තේ වෙළඳපොළ
## (කොළඹ තේ වෙන්දේසිය)

### සාමාන්‍ය අලෙවි මිල

| උන්නතාංශය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 (කි.ග්‍රෑ/ රු) | 2018 (කි.ග්‍රෑ/ රු) | |
| උඩරට තේ | 601.30 | 572.06 | -4.86 |
| මැදරට තේ | 563.11 | 521.66 | -7.34 |
| පහතරට තේ | 637.90 | 601.15 | -5.76 |
| සමස්ත සාමාන්‍යය | 618.18 | 581.93 | -5.86 |

## අලෙවි ප්‍රමාණය

| උන්නතාංශය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 (කි.ග්‍රෑ/ මිලි) | 2018 (කි.ග්‍රෑ/ මිලි) | |
| උඩරට තේ | 58.01 | 56.89 | -1.93 |
| මැදරට තේ | 50.51 | 49.61 | -1.78 |
| පහතරට තේ | 190.72 | 184.81 | -3.09 |
| එකතුව | 299.24 | 291.31 | -2.65 |

## තේ අපනයනය

| විස්තරය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 288.98 | 282.37 | -2.29 |
| අපනයන ආදායම (රු.බි.) | 233.30 | 231.70 | -0.69 |
| නැ.වි.ස මිල (කි.ග්‍රෑ.රු.) | 807.44 | 820.75 | 1.65 |

## ශ්‍රී ලංකාවේ තේ අපනයනය හා ප්‍රතිඅපනයනය

| විස්තරය | සාම්ප්‍රදායික තේ | | හරිත තේ | | ක්ෂණික තේ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි) | නැ.වි.ස මිල කි.ග්‍රෑ/ රු. | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | නැ.වි.ස මිල කි.ග්‍රෑ/රු. | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | නැ.වි.ස මිල කි.ග්‍රෑ/රු. | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | නැ.වි.ස මිල කි.ග්‍රෑ/රු. |
| 2017 | | | | | | | | |
| අපනයනය | 273.67 | 789.36 | 2.40 | 1,538.90 | 2.12 | 1,250.13 | 278.19 | 799.35 |
| ප්‍රති අපනයනය | 8.17 | 854.94 | 2.62 | 1,517.46 | 0.00 | 2,143.11 | 10.79 | 1,016.08 |
| 2018 | | | | | | | | |
| අපනයනය | 266.93 | 797.8 | 2.37 | 1,698.62 | 2.48 | 1,319.49 | 271.78 | 810.41 |
| ප්‍රති අපනයනය | 8.34 | 892.75 | 2.25 | 1,802.58 | 0.00 | 1,753.90 | 10.59 | 1,086.20 |

වර්ෂ 2018 දී ශ්‍රී ලංකාව විසින් තේ අපනයනය කරනු ලැබූ ප්‍රධාන රටවල්

| ප්‍රධාන රටවල් 10 | 2017 | | 2018 | | වැඩිවීම/අඩුවීම | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | මුළු අපනයනයේ ප්‍රතිශතයක් ලෙස % | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | මුළු අපනයනයේ ප්‍රතිශතයක් ලෙස % | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | % |
| ඉරාකය | 35,032,772 | 12.12 | 38,435,935 | 13.61 | 3,403,163 | 9.71 |
| තුර්කිය | 37,815,700 | 13.09 | 35,634,255 | 12.62 | -2,181,445 | -5.77 |
| රුසියාව | 33,379,977 | 11.55 | 30,580,653 | 10.82 | -2,799,324 | -8.39 |
| ඉරානය | 27,418,910 | 9.49 | 23,914,223 | 8.47 | -3,504,688 | -12.78 |
| ලිබියාව | 11,609,461 | 4.02 | 13,686,442 | 4.85 | 2,076,981 | 17.89 |
| එ.අරාබි එමීර් රාජ්‍යය | 15,785,266 | 5.46 | 11,077,796 | 3.92 | -4,707,470 | -29.82 |
| අසර්බයිජානය | 12,271,107 | 4.25 | 10,550,857 | 3.74 | -1,720,251 | -14.02 |
| සිරියාව | 7,399,616 | 2.56 | 10,180,344 | 3.61 | 2,780,728 | 37.58 |
| චීනය | 9,903,199 | 3.43 | 10,020,245 | 3.55 | 117,046 | 1.18 |
| චිලී | 7,096,964 | 2.46 | 7,540,045 | 2.67 | 443,081 | 6.24 |

## තේ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම්

- තේ කර්මාන්තය මුහුණ දී ඇති අභියෝග ජය ගැනීම සඳහා පස් අවුරුදු සැලැස්මක් සකස් කිරීමෙහි මූලික කටයුතු සැලසුම් කිරීම.
- කවසාකි කිකෝ සමාගම විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා තේ පර්යේෂණ ආයතනය සමඟ එක්ව තේ වගාවේ යාන්ත්‍රීකරණය ඇතුළු යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව දැනුම හුවමාරු කර ගැනීමේ සහ එම දැනුම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
- කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම විසින් නිෂ්පාදිත තේ, මහජන චීන සමූහාණ්ඩුව තුළ ප්‍රචලිත කිරීම සඳහා ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීමට සැලසුම් කිරීම.

1957 අංක 51 දරන තේ පාලන පනත සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.

1993 අංක 52 දරණ තේ පර්යේෂණ මණ්ඩල සංශෝධිත පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම

1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ තේ නැවත වගා සහ නව වගා සහනාධාර නියෝග සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

තේ තොග අපනයනය මත සෙස් බදු ගණනය කිරීමේදී කිලෝ ග්‍රෑමයට රු.10/- ක් හෝ කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල ගණන් වලින් 2.5% හෝ යන දෙකෙන් වැඩි අගය සැලකිල්ලට ගෙන මාසික පදනමකින් ගණනය කිරීම හේතුවෙන් තේ අපනයනකරුවන් හට දුෂ්කරතා මතු වී තිබූ බැවින් තේ අපනයනයේදී තේ කිලෝ ග්‍රෑම් 01 ක් සඳහා රු.10/- ක ස්ථාවර සෙස් බද්දක් අයකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන අදාළ ගැසට් නිවේදනය පළ කිරීම.

තේ පර්යේෂණ ආයතනය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ Michigan State University අතර අන්තර්ජාතික මට්ටමේ පර්යේෂණ හා අධ්‍යාපනික සහයෝගිතාව සම්බන්ධ අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගැනීමට මූලික කටයුතු සිදු කිරීම.

මෙරට තේ වගාව හා සම්බන්ධ පළිබෝධ හා රෝග කළමනාකරණය සඳහා ඵලදායී ජෛව පාලන කාරකයන් හඳුනා ගැනීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම සඳහා ඉන්දියාව සමඟ අවබෝධතා ගිවිසුමක් 2018.07.01 දිනැතිව අත්සන් කිරීම.

තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව එහි කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම.

- ❖ සුභ සාධන අංශයේ සමූහ රක්ෂණ වාරික මුදල් ගෙවීම වෙනුවෙන් රු. මිලියන 12 ක මුදලක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලබා දීම.

- ❖ ගිවිසුම්ගත කොන්දේසි කඩකරන ලද වලහන්දුව සහ මහවැලි යන කර්මාන්තශාලා නැවත තේ ශක්ති අරමුදල වෙත පවරා ගන්නා ලද අතර එම කර්මාන්තශාලා නැවත බදු දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ❖ අයිතිය පවරා ගෙන නොමැති තේ ශක්ති කර්මාන්තශාලා පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම (පස්සර, ඇල්පිටිය, රයිගම්කෝරලය, වලහන්දුව, අරමනාගොල්ල පොහොර ගබඩාව)

❖ බණ්ඩාරවෙල කම්කරු විනිශ්චය සභාව විසින් ලබාදුන් නියෝගය පරිදි කැප්පෙටිපොල කම්හලේ සේවකයන් හට ගෙවිය යුතු සේවක වන්දි මුදල වූ රු. මිලියන 6 ක මුදල හපුතලේ කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීම.

- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, අන්තර්ජාතික කම්කරු සංවිධානය සමඟ ඒකාබද්ධව රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල කුඩා තේ වතු හිමියන් සඳහා ආපදාවලට ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා “Flood Resilience Programme” ලෙස නියමු ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

- තේ ශක්ති අරමුදල සතු හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම වෙත පවරා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- තේ වගාව සඳහා පනවා තිබූ ග්ලයිෆොසේට් වල් නාශකය ආනයන තහනම මාස 36ක් සඳහා ඉවත් කිරීමට කටයුතු කිරීම

## තේ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- කුඩා තේ වතු ආදර්ශ වගා පිහිටුවීම හා කුඩා තේ වතු හිමියන් කුඩා පරිමාණ ව්‍යවසායකයින් ලෙස නඟා සිටුවීම සඳහා වැඩසටහනක් Unilever Sri Lanka Ltd. ආයතනය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම. මේ සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ උප කාර්යාල බල ප්‍රදේශ 26 ක් යටතේ වගා ආදර්ශන 26 ක් ස්ථාපිත කිරීම.

- තේ නැවත වගාව හා පාළු සිටුවීම දිරිමත් කිරීමට වසර 04 ක කාල සීමාවකට අදාළ වන පරිදි අරමුදලක් ස්ථාපිත කිරීම.

- නව වගාව, නැවත වගාව සහ පාළු සිටුවීම සඳහා වන පැළ අවශ්‍යතාවය සපුරාගැනීමේ වැඩසටහනක් අදාළ ආයතන හා වැවිලි සමාගම් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අදාළ 1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනයට අදාළව නීති කෙටුම්පත් සම්පාදකගේ මූලික කෙටුම්පත ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත. එමෙන්ම තේ මණ්ඩලය සඳහා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට අදාළව 2018 අංක 13 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත සංශෝධන කිරීම.

- 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත සංශෝධනය සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් එවන ලද නිරීක්ෂණ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංශෝධන හඳුනාගෙන යොමු කර ඇත. එමෙන්ම තේ නැවත වගා සහ නව වගා සහනාධාර නියෝග සංශෝධනය අවසන් කර එහි ඉදිරි පියවර සඳහා නීති කෙටුම්පත් වෙත යොමු කිරීමට පියවර ගැනීම.

- 1993 අංක 52 දරණ තේ පර්යේෂණ මණ්ඩල පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීමට නියමිතය.

- 1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත සංශෝධනය හා අදාළ මූලික කෙටුම්පත නිරීක්ෂණ ලබා ගැනීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත යොමු කිරීම.



# රබර් ක්ෂේත්‍රය

## සමාලෝචනය

වර්ෂ 2018 දී රබර් නිෂ්පාදනය කි.ග්‍රෑ.මිලි 82.56ක් වූ අතර එය 2017 වර්ෂයට සාපේක්ෂව 0.65%කින් පහළ යාමකි. ගෝලීය ස්වභාවික රබර් සැපයුම ඉහළ යාමෙන් මතුව ඇති මිල පහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ද රබර් මිල පහල යාම හේතුවෙන් රබර් කිරි කැපීම සඳහා වගාකරුවන් උනන්දු නොවීම රබර් නිෂ්පාදනය ඉහළ නොයෑමට හේතුවිය. මේ නිසාම රබර් නිෂ්පාදනයේ ඵලදායීතාවය ද 2017 වර්ෂයේදී හෙක්ටයාරයකට කි.ග්‍රෑ 809ක් වාර්තා වූ අතර එය 2018 වර්ෂයේදී 780.4ක් විය.

ආර්.එස්.එස්. (දුම් ගැසූ) රබර් කාණ්ඩ 05 සඳහාම වාර්තා වූ රබර් වෙන්දේසි මිල ගණන් 2017 වර්ෂයට සාපේක්ෂව 15.6% සිට 19.35% දක්වා පරාසයකින් පහළ ගොස් තිබුණි. ස්වභාවික රබර් නිපදවන ප්‍රධාන රටවල් අතරින් තායිලන්තය, ඉන්දුනීසියාව, වියට්නාමය, චීනය හා පිලිපීනය යන රටවල්වල නිෂ්පාදනය 2017ට සාපේක්ෂව ඉහළ යාම නිසා ස්වභාවික රබර් මිල පහළ යාම ශ්‍රී ලංකාවේ රබර් මිලට ද බලපෑමක් විය.

2018 වර්ෂයේ නිෂ්පාදනය වූ අමු රබර් කි.ග්‍රෑ.මිලි 82.56න් කි.ග්‍රෑ.මිලි 13.98ක් හෙවත් 16.94%ක් අපනයනය කර ඇත. නමුත් 2017 දී නිෂ්පාදනයෙන් 20.74%ක් අපනයනය වී තිබුණි. අගය එකතු කිරීම් සඳහා දේශීය අමු රබර් යොදා ගැනීම ඉහළ යාම සිදුව ඇත. අගය එකතු කිරීම සඳහා රට තුළ භාවිතා වූ සමස්ත රබර් ප්‍රමාණය කි.ග්‍රෑ.මිලි 135.23ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 5.5%ක ඉහළ යාමකි. අමු රබර් අපනයනයෙන් ලද ආදායම රු.බිලි 5.09ක් වන අතර අගය එකතු කිරීම මඟින් ලද අපනයන ආදායම රු.බිලි 142.29කි. සමස්ත අපනයන ආදායම රු. බිලි 147.39ක් වන අතර පෙර වර්ෂයට සාපේක්ෂව 10.87%ක ඉහළ යාමකි.

රබර් නව වගා සහනාධාරය හෙක්ටයාරයකට රු. 150,000 සිට රු. 300,000 දක්වා ද රබර් නැවත වගා සහනාධාරය රු. 175,000 සිට රු. 350,000 දක්වා ද ඉහළ නංවන ලදී. එසේම රබර් කිරි කපන්නන්ගේ හිඟය අවම කිරීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ආරම්භ කරනු ලැබිය. කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්කයන්ගේ නව රබර් වගාව ද ඇතුළුව හෙක්ටයාර 973 ක නව රබර් වගාවත් හෙක්. 842ක රබර් නැවත වගාවක් සිදුකර ඇත.

## රබර් ක්ෂේත්‍රයේ සමස්ත කාර්යසාධනය

| විස්තරය | වර්ෂය | | ඉලක්ක |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| නිෂ්පාදන ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි) | 83.10 | 82.56 | 84.30 |
| ඵලදායිතාවය (හෙක්/කි.ග්‍රෑ) | 809.00 | 780.40 | 871.00 |
| අපනයන ආදායම (රු.බිලි) | 133.34 | 147.39 | 160.00 |
| නැවත වගාව (හෙක්) | 1,187.00 | 842.00 | 2,700.00 |
| නව වගාව (හෙක්) (STaRR ව්‍යාපෘතිය ද ඇතුළුව) | 1,035.00 | 973.00 | 2,244.00 |

## රබර් වගාවේ ව්‍යාප්තිය

රබර් වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)

| දිස්ත්‍රික්කය | 2017 (හෙක්.) | 2018 (හෙක්.) ඉලක්ක |
|---|---|---|
| රත්නපුර | 27,690.99 | 27,858.06 |
| කොළඹ | 6495.15 | 6,518.25 |
| කෑගල්ල | 39,311.34 | 39,178.63 |
| කුරුණෑගල | 3,176.09 | 3,189.19 |
| ගම්පහ | 4,030.83 | 4,027.13 |
| මහනුවර | 1,898.79 | 1,916.25 |
| මාතලේ | 1,321.53 | 1,327.69 |
| නුවරඑළිය | 6.00 | 5.48 |
| කළුතර | 29,682.85 | 29,759.63 |
| ගාල්ල | 6,223.52 | 6,243.50 |
| මාතර | 4,288.26 | 4,292.88 |
| හම්බන්තොට | 251.61 | 260.06 |
| මොණරාගල | 8,359.51 | 8,378.75 |
| බදුල්ල | 2,084.08 | 2,094.19 |
| අම්පාර | 1,731.86 | 1,753.00 |
| පුත්තලම | 15.00 | 15.00 |
| වවුනියාව | 49.43 | 49.43 |
| අනුරාධපුරය | 5.62 | 5.48 |
| පොළොන්නරුව | 3.03 | 2.74 |
| එකතුව | 136,625.49 | 136,875.34 |

රබර් වගා භූමි ප්‍රමාණය

| අංශය | වගා භූමි ප්‍රමාණය (හෙක්.) | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 ඉලක්කය |
| කුඩා රබර් වතු අංශය | 88,412 | 89,012 | 89,662 |
| සංස්ථායික අංශය | 48,213 | 47,863 | 47,463 |
| එකතුව | 136,625 | 136,875 | 137,125 |

## රබර් නිෂ්පාදනය

රබර් වර්ගය අනුව නිෂ්පාදනය

| වර්ගය | වර්ෂය | |
|---|---|---|
| | 2017 (කි.ග්‍රෑ) | 2018 (කි.ග්‍රෑ) |
| ෂීට් රබර් | 41,522,977 | 41,280,150 |
| සෝල් ක්‍රේප් | 1,476,453 | 1,438,769 |
| ස්ක්‍රැප් | 830,459 | 2,620,006 |
| ලේටෙක්ස් ක්‍රේප් | 9,159,952 | 10,450,751 |
| ටී.එස්.ආර් | 1,204,380 | 765,622 |
| ලේටෙක්ස් සහ වෙනත් | 28,875,912 | 26,005,000 |
| එකතුව | 83,070,133 | 82,560,300 |

## රබර් අංශයේ ඵලදායීතාවය

| වර්ෂය | හෙක්./කි.ග්‍රෑ |
|---|---|
| 2016 | 908.3 |
| 2017 | 809.0 |
| 2018 | 780.4 |

## රබර් අලෙවි මිල

### දේශීය රබර් අලෙවි මිල

| රබර් වර්ගය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 (කි.ග්‍රෑ./රු.) | 2018 (කි.ග්‍රෑ./රු.) | |
| ආර්.එස්.එස් 1 | 337.27 | 281.64 | -16.49 |
| ආර්.එස්.එස් 2 | 330.48 | 266.58 | -19.33 |
| ආර්.එස්.එස් 3 | 324.50 | 263.11 | -18.92 |
| ආර්.එස්.එස් 4 | 311.53 | 251.26 | -19.35 |
| ආර්.එස්.එස් 5 | 295.79 | 249.63 | -15.61 |

## රබර් අපනයන ආදායම

| වර්ගය | වර්ෂය | | වෙනස (%) |
|---|---|---|---|
| | 2017 (රු.බිලි.) | 2018 (රු.බිලි.) | |
| අමු රබර් | 5.92 | 5.09 | -14.02 |
| අර්ධ නිමි | 0.64 | 0.63 | -1.56 |
| නිමි නිෂ්පාදන | 126.78 | 141.67 | 11.74 |
| එකතුව | 133.34 | 147.39 | 10.54 |

## අමු රබර් අපනයනය

### අමු රබර් නිෂ්පාදනය සහ අමු රබර් අපනයනය

| වර්ෂය | රබර් නිෂ්පාදනය (මෙ.ටො.) | අපනයන ප්‍රමාණය (මෙ.ටො.) | නිෂ්පාදනයෙන් අපනයනය % | අපනයන ආදායම (රු.මිලි.) |
|---|---|---|---|---|
| 2017 | 83,070 | 17,230.3 | 20.74 | 5,920 |
| 2018 | 82,560 | 13,982.0 | 16.94 | 5,088 |

විවිධ වර්ගවල අමු රබර් අපනයනය

| වර්ගය | වර්ෂය | | වෙනස % |
|---|---|---|---|
| | 2017 (මෙ.ටො.) | 2018 (මෙ.ටො.) | |
| ෂීට් රබර් | 2,940 | 1369 | -53.44 |
| සෝල් ක්‍රේප් | 1406 | 1328 | -5.55 |
| ලේටෙක්ස් ක්‍රේප් | 7633 | 8727 | 14.33 |
| ටී.එස්.ආර්. | 899 | 554 | -38.38 |
| ලේටෙක්ස් හා වෙනත් | 4352 | 2005 | -53.93 |

## අගය එකතු කළ රබර් නිෂ්පාදනයන්

| විස්තරය | වර්ෂය | |
|---|---|---|
| | 2017 | 2018 |
| අගය එකතු කිරීම සඳහා භාවිතා වූ ප්‍රමාණය (කි.ග්‍රෑ.මිලි.) | 128,142 | 135,238 |
| පෙර වර්ෂයේ සමාන කාල සීමාව හා සැසඳීමේදී වෙනස (%) | -9.7 | 5.54 |

## ගෝලීය ස්වභාවික රබර් නිෂ්පාදනය

| රට | 2017 (කි.ග්‍රෑ.මිලි) | 2018 (කි.ග්‍රෑ.මිලි) |
|---|---|---|
| තායිලන්තය | 4429 | 4883 |
| ඉන්දුනීසියාව | 3629 | 3774 |
| වියට්නාමය | 1095 | 1100 |
| චීනය | 798 | 833 |
| මැලේසියාව | 740 | 600 |
| ඉන්දියාව | 713 | 619 |
| කම්බෝජය | 193 | 220 |
| පිලිපීනය | 102 | 111 |
| ශ්‍රී ලංකාව | 83 | 82 |

## රබර් ක්ෂේත්‍රයට අදාලව සිදුකරන ලද විශේෂ ක්‍රියාකාරකම්

- රබර් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා රබර් නව වගා සහනාධාරය හෙක්ටයාරයකට රු. 150,000/- සිට රු. 300,000/- දක්වාද රබර් නැවත වගා සහනාධාරය හෙක්ටයාරයකට රු. 175,000/- සිට රු. 350,000/- දක්වාද ඉහළ නැංවීම.

- කේන්ද්‍රාපසාරී රබර් කිරි අපනයනයේදී එහි වියළි බර ප්‍රතිශතය වන 60 % ක බර ප්‍රමාණය පාදක කර ගෙන පමණක් සෙස් බදු අය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

- රබර් වගාව සඳහා පනවා තිබූ ග්ලයිෆොසේට් වල් නාශකය ආනයන තහනම මාස 36 ක කාලයක් සඳහා ඉවත් කිරීම සඳහා කටයුතු කිරීම

- ශ්‍රී ලංකා රබර් කර්මාන්ත සංවර්ධන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම (Rubber Industry Master Plan) (2017 - 2026)

❖ ශ්‍රී ලංකා රබර් ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපනය කරන ලද රබර් ලේකම් කාර්යාලය සඳහා මහලේකම්වරයෙකු පත් කිරීම හා එහි කටයුතු ආරම්භ කිරීම.

❖ ශ්‍රී ලංකා රබර් ප්‍රධාන සැලැස්මට අදාළ සංවර්ධන ව්‍යාපෘති අතරින් 04ක කටයුතු ආරම්භ කිරීම.

- **රබර් නැවත වගා අරමුදල හා රබර් පාලන අරමුදල ඈවර කිරීම**

  අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රබර් නැවත වගා අරමුදල හා රබර් පාලන අරමුදල ඈවර කිරීම සඳහා ඈවරකරුවෙකු පත් කර ඔහු විසින් ලබා දුන් ගිණුම් වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කරන ලදී. මේ සම්බන්ධව විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

- **ස්වාභාවික රබර් නිපදවන රටවල්වල සංගමයේ කටයුතු**

  ❖ 2018.02.05 – 2018.02.08 දින දක්වා මැලේසියාවේදී පැවති "Rubber Market Analysis and Research" යන මැයෙන් වූ පුහුණු වැඩමුළුව සඳහා අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගීවීම.

  ❖ 2018.03.14 – 2018.03.16 දින දක්වා තායිලන්තයේදී පැවති "Rubberized Road – 2018" යන සම්මන්ත්‍රණය සඳහා රබර් පර්යේෂණ ආයතනයේ නිලධාරීන් සහභාගීවීම.

  ❖ 2018.04.17 – 2018.04.19 දින දක්වා ඉන්දුනීසියාවේදී පැවති ස්වභාවික රබර් මිල ස්ථායීකරණ කමිටු රැස්වීම සඳහා අමාත්‍යාංශය සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගීවීම.

- 2018.06.19 – 2018.06.21 දින දක්වා තායිලන්තයේදී පැවති “Towards Supply Chain Efficiency” යන මැයෙන් වූ වැඩමුළුව සඳහා අමාත්‍යාංශය සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගිවීම.

- 2018.07.02 – 2018.07.05 දින දක්වා පිලිපීනයේ පැවති “Supply, Demand and Modeling of Natural Rubber Industry” යන මැයෙන් වූ වැඩමුළුව සඳහා අමාත්‍යාංශය සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී වීම.

- 2018.10.08 – 2018.10.13 දක්වා තායිලන්තයේදී පැවති ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ වාර්ෂික රැස්වීම සඳහා අමාත්‍යාංශය හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගිවීම.

**රබර් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම.**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, රබර් පර්යේෂණ ආයතනය හා තුරුසවිය අරමුදල යන ආයතන සම්බන්ධීකරණයෙන් රබර් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා තුන් අවුරුදු (2018 – 2020) ක්‍රියාකාරී සැලැස්මක් අමාත්‍යාංශය විසින් සකස් කර ක්‍රියාත්මක කිරීම.

තුරුසවිය අරමුදල අනුග්‍රහයෙන් රබර් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඇති කිරීම පිණිස අමාත්‍යාංශය විසින් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ සාමාජිකයින් විසින් රත්නපුර, මොණරාගල සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල තුරුසවිය සමිති හා සමූහ සැකසුම් මධ්‍යස්ථාන අධ්‍යයනය කර තෝරා ගත් සමිති/ සමූහ සැකසුම් මධ්‍යස්ථානයන්හි අලෙවි මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා මූලික කටයුතු සිදුකිරීම.

**රබර් වගාවේ ව්‍යාප්ති සේවා විධිමත් කිරීම.**

රබර් පර්යේෂණ ආයතනයේ ව්‍යාප්ති සේවා අංශය විසින් කුඩා රබර් වතු අංශයේ ඍජු ව්‍යාප්ති සේවා පැවැත්වීම වෙනුවට ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ අක්කර 50 ට වැඩි පෞද්ගලික රබර් වගාවන් සඳහාද රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරීන් මගින් සියළුම කුඩා රබර් වතු හිමියන් සඳහාද සේවා සපයන පරිදි ව්‍යාප්ති සේවා සැපයීම විධිමත් කිරීම. එසේම රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රබර් සංවර්ධන නිලධාරීන් අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා කතිකාවතක් ඇරඹීමට කටයුතු යෙදීම.

ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව සතු ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව බදු දීම සඳහා වන මූලික කටයුතු සිදුකිරීම.

## රබර් ක්ෂේත්‍රය වෙනුවෙන් 2019 වර්ෂයේදී සිදුකිරීමට නියමිත විශේෂ ක්‍රියාකාරකම්

**රබර් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීමේ විශේෂ වැඩසටහන**

ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සකස් කර ඇති 2018 – 2020 තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පහත පියවරයන් ගැනීම.

- කිරි කැපීම යාන්ත්‍රීකරණය සඳහා පර්යේෂණ කටයුතු සිදු කිරීමට සහය සැලසීම.
- රබර් වගා කරන සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ආදර්ශ වගා ඇති කිරීම
- ව්‍යාප්ති නිලධාරීන් අධීක්ෂණය කිරීමේ කටයුතු විධිමත් කිරීමේ අරමුණින් බර තැබූ ලකුණු ක්‍රමයකට අනුව කාර්ය සාධන ඇගයීම් ක්‍රමයක් සකස් කිරීම.

ශ්‍රී ලංකා රබර් කර්මාන්ත සංවර්ධන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම (2017- 2026)

2019 වර්ෂය සඳහා රු. මිලියන 50 ක් වෙන් කිරීමට යෝජිත අතර ඒ සැලැස්මක් ඉදිරිපත් කිරීමට නියමිතය. මේ යටතේ රබර් ප්‍රධාන සැලැස්මේ අඩංගු ව්‍යාපෘති 25 ප්‍රමුඛතා පදනම මත ක්‍රියාවට නැංවීමට නියමිත වේ.

රබර් ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවා විධිමත් කිරීම.

රබර් ක්ෂේත්‍රයේ ව්‍යාප්ති සේවා විධිමත් කිරීම සඳහා තවදුරටත් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කිරීම.

රබර් ඉඩම්වල උපයෝගිතාව වැඩි කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වී වැඩසටහනක් ආරම්භ කිරීම.

ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ සාමාජිකයෙකු වශයෙන් පැවරෙන කාර්යභාරය ඉටුකිරිම.

ජාත්‍යන්තර රබර් අධ්‍යයනය කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් පැවරෙන කාර්යභාරය ඉටුකිරීම.

උතුරු පළාතේ රබර් වගාව ව්‍යාප්ත කිරිමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම.

**සී/ස/ රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට සම්බන්ධ කටයුතු**

- ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව අවුරුදු 30 කට බදු දීම සඳහා ඉදිරි කටයුතු සිදුකිරීම.
- පෞද්ගලික ආයොජකයන් හට බදු දී ඇති කර්මාන්තශාලාවන් සම්බන්ධ ගැටළු විසඳීම.



# පොල් ක්ෂේත්‍රය

## සමාලෝචනය

වර්ෂ 2018 දී පොල් අස්වැන්න ගෙඩි මිලියන 2623ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂ 7.1%ක ඉහළ යාමකි. පසුගිය වර්ෂය අග සිට ප්‍රධාන පොල් වගා ප්‍රදේශයන්ට ලැබුණු සතුටුදායක වර්ෂා තත්ත්වය හේතුවෙන් 2018 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට පොල් අස්වැන්න ඉහළ යනු ලැබීය. මේ තත්ත්වය මත 2017 ජූනි මස සිට තාවකාලිකව අත්හිටුවා තිබූ ගෙඩි පොල් අපනයන තහනම 2018 අගෝස්තු 31 සිට ඉවත් කරනු ලැබීය.

පසුගිය වර්ෂයේ මුල සිට ඉහළ යනු ලැබූ කොළඹ පොල් වෙන්දේසි පොල් මිල 2018 දෙවන කාර්තුවේ අග සිට අඛණ්ඩව පහළ යනු ලැබීය. රටේ පොල් අස්වැන්න පසුගිය වර්ෂයට සාපේක්ෂව ක්‍රමයෙන් ඉහළ යෑම මීට හේතුවිය. කොළඹ පොල් වෙන්දේසියේදී 2018 වර්ෂයේ සාමාන්‍ය පොල් මිල ගෙඩියකට රු. 45.55ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 6.3%ක පහළ යාමකි. පොල් තොග මිල 3.2%කින් පහළ යනු ලැබූ නමුත් සිල්ලර මිලෙහි සාමාන්‍යය වර්ෂ දෙකෙහිම සමාන මට්ටමක පැවතුණි.

පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනයන් මඟින් ලැබුණු ආදායම රු.බිලි 94.72ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 3.86%ක ඉහළ යාමකි. ප්‍රධාන වශයෙන් පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම රු.බිලි 12.69 සිට රු.බිලි 15.79 දක්වා 24.4% කින් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. පසුගිය වර්ෂයේ සිට පහළ යනු ලැබූ දියිදි පොල් නිෂ්පාදනය වර්ෂයේ අග මාස 03 දී පෙර වර්ෂයේ අග මාස 03ට සාපේක්ෂව ඉහළ යාම විශේෂයෙන් කැපී පෙනුනි.

දෙමුහුන් පොල් පැළ නිෂ්පාදනය හා උසස් අස්වැන්නක් සහිත පොල් පැළ නිෂ්පාදනය ඉහළ නැංවීමේ ව්‍යාපෘතීන් දෙකක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අඛණ්ඩව මෙම වර්ෂ දෙකේදී සාර්ථකව ක්‍රියාත්මක කෙරුණි. කුඩා පරිමාණ පොල් වගාකරුවන් හා පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතීන් දෙකක් ද සාර්ථකව ක්‍රියාත්මක කෙරුණි.

## පොල් ක්ෂේත්‍රයේ සමස්ත කාර්යසාධනය

| විස්තරය | ප්‍රගතිය | | ඉලක්ක |
|---|---|---|---|
| | වර්ෂ 2017 | වර්ෂ 2018 | වර්ෂ 2019 |
| පොල් අස්වැන්න (ගෙඩි මිලි.) | 2,449.53 | 2,623.10 | 2900.00 |
| අපනයන ආදායම (රු.බිලි.) | 91,198.13 | 94,722.62 | 105,000.00 |
| ඵලදායිතාව (හෙක්./ගෙඩි) | 5,518.00 | 5,908.00 | 6,531.00 |
| පොල් පැළ නිෂ්පාදනය(පැළ මිලි.) | 3.43 | 2.37 | 3.00 |
| නව වගාව (හෙක්) | 15,121.00 | 8,198.00 | 9,250.00 |
| නැවත වගාව (හෙක්) | 1,007.00 | 543.00 | 600.00 |
| යටි වගාව (හෙක්) | 7,817.00 | 4,006.00 | 3,000.00 |

## පොල් මිල

| මිල වර්ගය | දෙසැම්බර් 31 වන විට වාර්ෂික මිලෙහි සාමාන්‍යය (ගෙඩියක මිල රු.) | | |
|---|---|---|---|
| | 2017 | 2018 | වෙනස % |
| වෙන්දේසි (කොළඹ) | 48.62 | 45.55 | -6 |
| තොග | 62.71 | 60.68 | -3 |
| සිල්ලර | 70.70 | 70.76 | 0.1 |

## අපනයන උච්චාවචනය

| වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා | | |
|---|---|---|---|
| | 2017 (රු.මි.) | 2018 (රු.මි.) | වෙනස % |
| පොල් මද ආශ්‍රිත | 47,614.91 | 47,978.65 | 0.76 |
| කෙඳි | 4,560.08 | 4,560.50 | 0.01 |
| කෙඳි නිමි නිෂ්පාදන | 26,019.75 | 26,048.54 | 0.11 |
| කටු ආශ්‍රිත නිෂ්පාදන | 12,692.96 | 15,794.67 | 24.44 |
| වෙනත් | 310.43 | 340.26 | 9.61 |
| එකතුව | 91,198.13 | 94,722.62 | 3.86 |

## අපනයන ආදායම

| වර්ගය | ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො.) | | | ආදායම (රු.මිලි.) | | |
| | 2017 | 2018 | වෙනස % | 2017 | 2018 | වෙනස % |
| පොල් තෙල් (මෙ.ටො.) | 6,310 | 4,606 | -27 | 3,815.56 | 3,019.96 | -21 |
| පිරිසිදු පොල් තෙල් (මෙ.ටො.) | 13,816 | 12,006 | -13 | 10,590.29 | 9,528.19 | -10 |
| පොල් වතුර (මෙ.ටො.) | 3,945 | 5,047 | 28 | 686.26 | 723.20 | 5 |
| තැඹිලි (ගෙඩි) | 5,155,971 | 5,894,634 | 14 | 459.70 | 528.85 | 15 |
| අමු පොල් (ගෙඩි)* | 10,232,305 | 1,432,640 | - | 831.94 | 110.74 | - |
| බ්‍රිස්ටල් කෙදි (මෙ.ටො.) | 24,068 | 2,025 | -92 | 1,221.93 | 558.64 | -54 |

*2018 අගෝස්තු 31 දක්වා අපනයනය තහනම් කර තිබුනි

## පාර්ශවකරුවන් පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය

| වර්ගය | වර්ෂ 2017 | වර්ෂ 2018 |
|---|---|---|
| අපනයනකරුවන් | 553 | 547 |
| බ්‍රෝකර්වරුන් | 16 | 17 |
| වෙළඳුන් (පොල් වතු) | 257 | 237 |
| දිසිදි නිෂ්පාදකයින් | 50 | 46 |
| කොහු ආශ්‍රිත කර්මාන්තකරුවන් | 321 | 623 |
| ගැණුම්කරුවන් | 88 | 62 |
| පොල් තෙල් නිෂ්පාදකයින් | 82 | 123 |

## විදෙස් ප්‍රදර්ශන

| ප්‍රදර්ශනය | රට | සහභාගී වූ අපනයනකරුවන් සංඛ්‍යාව |
|---|---|---|
| **IPM 2018** උද්‍යාන සහ ගෙවතු අලංකරණය පිළිබඳ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | ජර්මනිය | **05** |
| **Food & Drink Expo** ආහාර හා පාන වර්ග පිළිබඳ ප්‍රදර්ශනය | එක්සත් රාජධානිය | **06** |
| **SAITEX 2018 -** පොල් මද ආශ්‍රිත වෙළඳප්‍රදර්ශනය | දකුණු අප්‍රිකාව | **04** |
| **Find food -** පොල් ආශ්‍රිත වෙළඳ ප්‍රදර්ශනය | ඕස්ට්‍රේලියාව | **05** |
| **International Plants Expo ( IPM)** | ඩුබායි | **05** |
| **SIAL -** පොල් මද ආශ්‍රිත වෙළඳ ප්‍රදර්ශනය | ප්‍රංශය | **05** |

## පොල් ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක කළ විශේෂ ක්‍රියාකාරකම්

- දිවයින පුරා පැවති පොල් හිඟය හේතුකොටගෙන සිදුවූ පොල් මිල ගණන් ඉහළ යාම නිසා කොළඹ හා තදාසන්න ප්‍රදේශ මූලිකව දිවයිනේ ප්‍රදේශ රැසක 'කප්රුක' සමිතිවල ද සහයෝගය ඇතිව රු.65.00ක උපරිම සිල්ලර මිලක් යටතේ පාරිභෝගිකයන් වෙත ගෙඩි පොල් 624,469 ක් බෙදා හරින ලදී.

- ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට සහ ජාතික ආර්ථිකයට වැදගත් පොල් වගාවේ උන්නතිය උදෙසා ජාත්‍යන්තර පොල් දිනයට සමගාමීව ජාතික පොල් වගා ප්‍රවර්ධන සතියක් 2018.09.02-2018.09.07 දින දක්වා ක්‍රියාත්මක කරන ලදි.

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා චීන සමූහාණ්ඩුවේ කෘෂි විද්‍යා පිළිබඳ අධ්‍යයන ආයතනය අතර සහයෝගීතාවය ඇති කිරීමේ අරමුණින් 2018.08.09 දින අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ ලියවිල්ලක් අත්සන් කිරීම.

- පොල් වගාකරුවන් වෙත වඩාත් ඵලදායී සේවාවක් ලබාදීම සඳහා ප්‍රාදේශීය බල ප්‍රදේශයන්ට අදාළ අක්කර 20ට වැඩි, අක්කර 5-20 අතර හා අක්කර ¼-05 අතර පොල් ඉඩම් ලියාපදිංචියට කටයුතු කිරීම.

- තේ, රබර් හා පොල්වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලයේ අනුමැතියකින් තොරව හෙක්ටයාර 4ට වැඩි පොල් ඉඩම් කැබලි කිරීම වලක්වා විධිමත් අනුමැතීන් සඳහා යොමු කරවන ලෙස අදාල රාජ්‍ය ආයතන දැනුවත් කිරීම.

- ගෙඩි පොල් අපනයනය විධිමත්ව නියාමනය කිරීම හා ශීත කළ පොල් මද ආනයනය තුළින් දේශීය කර්මාන්ත සඳහා වන පොල් අවශ්‍යතාවය සපුරා ගැනීමට කටයුතු කිරීම.

- බාදා තෙල් සඳහා වන බදු ප්‍රතිපත්පත්තිය උපාය මාර්ගිකව යොදා ගනිමින් දේශීය පොල් මිල පාලනය කිරීමට කටයුතු කිරීම.

- ජාත්‍යන්තර වෙලඳපොලේ ඉහළ ඉල්ලුමක් වර්ධනය වන පොල් වතුර කර්මාන්තය සඳහා අවශ්‍ය පොල් වතුර ප්‍රති අපනයනය කිරීම සඳහා කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් සපයාදීම.

## පොල් ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

- ජාත්‍යන්තර ස්වභාවික කෙඳි සමුළුව (INFO) සමඟ එක්ව කොහු කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට දිගුකාලීන මාර්ගෝපදේශ සැලැස්මක් සකස්කිරීම.

- පොල් ඉඩම් ශ්‍රේණිගත කිරීම සම්බන්ධයෙන් විධිමත් නිර්ණායක ඇතුලත් ක්‍රමවේදයක් සකස් කිරීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය මෙන්ම පොල් මිල සම්බන්ධ නියාමන කටයුතු සම්බන්ධීකරණය



# උක් ක්ෂේත්‍රය

## උක් ක්ෂේත්‍රයේ සමස්ත කාර්ය සාධනය

| විස්තරය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 ඉලක්ක |
| උක් වගා භූමි ප්‍රමාණය (හෙක්ටයාර) | 15,040 | 16,272 | 20,676 |
| උක් අස්වැන්න (මෙ.ටො.) | 744,315 | 786,110 | 914,913 |
| උක් ඵලදායීතාවය (හෙක්./මෙ.ටො.) | 54.8 | 58.01 | 59.09 |
| නව ප්‍රභේද හඳුන්වාදීම | 06 | - | 02 |

## උක් හා සීනි ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ප්‍රතිපත්තිමය කරුණු

- උක් පර්යේෂණ ආයතන හා ජාතික අධ්‍යාපන ආයතන අතර අන්තර් සබඳතාවය වර්ධනය වන වැඩසටහන් ක්‍රමවේදයක් සකස් කිරීම.
- සීනි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඇවරකිරීමට හා ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිත ආයතනවල කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම.
- සීනි කර්මාන්ත, උක් වගාව හා පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා විධිමත් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම.

# කටුපොල් ක්ෂේත්‍රය

කටුපොල් වගා ක්ෂේත්‍රයේ කටුපොල් වගාවට අවශ්‍ය බීජ තීරු බදු සහන යටතේ ආනයනය සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබාදීම මෙම අමාත්‍යාංශය මඟින් සිදුකරනු ලබයි.

- 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කටුපොල් බීජ ආනයනයට නව අනුමැතියන් ලබාදී නොමැත.

# අමාත්‍යාංශයීය අංශ අනුව කාර්යසාධනය

## වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (ශ්‍රී.ලං.රා.වැ.සං.) යටතේ පාලනය වූ මහා පරිමාණ වතු 463 ක් පෞද්ගලීකරණ වැඩපිළිවෙල යටතේ 1992 සිට බල පැවැත්වෙන පරිදි, ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත බදු දී ඇත. එම සමාගම්වල ස්වර්ණමය කොටස්කරු වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරී ඇති බලතල රාජ්‍ය අංශය වෙනුවෙන් මෙහෙයවීම මෙම අංශයේ කාර්යභාරය වේ. ඒ අනුව වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය මගින් පහත කාර්යයන් ඉටු කරනු ලැබ ඇත.

### ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් බදු කුලී අය කිරීම

